Rs. 5000/=

194822
11/11/2009

# මාවත්වාසී ළමයින්ගේ අපගාමී චර්යා රටාවන්

# කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රයෙන්

බෝපිටිය විදානලාගේ නිරංජි විජේවර්ධන

**GS/ SS/ 2297/2004**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යා...
25 MAR 2009

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති : අපරාධ විද්‍යාව විෂය

යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

**Libary - USJP**
194822

194823

# පටුන


පිටු අංකය

**I.** පටුන I - III

**II.** සංඛ්‍යාන වගු, ප්‍රස්තාර, සටහන්, සිතියම්, නාමාවලිය IV - VI

**III.** ස්තුතියි VII - IX

**IV.** සාරාංශය X - XI

**පළමුවැනි පරිච්ඡේදය : හැඳින්වීම** 01 - 07

1.1. අධ්‍යයනයේ පසුබිම සහ කාලීන වැදගත්කම

1.2 . අධ්‍යයනයේ අරමුණු

**දෙවැනි පරිච්ඡේදය : ක්‍රමවේදය** 08-30

2 . 1. පර්යේෂණ ගැටළුව

2 . 1 . 2. සාහිත්‍යය පරිශීලනය සහ ද්විතීයික දත්ත රැස්කිරීම

2 . 2. ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම

2. 3. 1. දත්ත විශ්ලේෂණය

2. 4. අධ්‍යයනයේ සීමාවන් සහ මුහුණ දුන් ගැටළු

2. 5. පර්යේෂණ නිබන්ධයේ ආකෘතිය

**තුන්වන පරිච්ඡේදය : සංකල්පමය සහ න්‍යායාත්මක විග්‍රහය** 31 - 78

3. 1. මාවත්වාසී ළමයින් හඳුනා ගැනීම

3. 2. ලෝකයේ විවිධ රටවල මාවත්වාසී ළමයින්ගේ ව්‍යාප්තිය හඳුනා ගැනීම.

3. 3. මාවත්වාසී ළමයින් සහ සමාජානුයෝජනය

3. 4. මාවත්වාසී ළමයින්ගේ අපගාමී නැඹුරුව

3. 5. මාවත්වාසී ළමයින් සම්බන්ධ අධ්‍යයන ආශ්‍රිත න්‍යායන්

3. 5. 1. අපරාධ නැඹුරුව කෙරෙහි බලපාන පාරිසරික සාධක

3. 5. 2. අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය

3. 5. 3. අනෝමීය න්‍යාය

3. 5. 4. අපරාධ ප්‍රභවය පිළිබඳ උපසංස්කෘතික න්‍යාය

3. 5.5. අපරාධ ප්‍රභවය පිළිබඳ ලේබල් න්‍යාය

3. 5. 6. සංස්කෘතික ගැටුම පිළිබඳ න්‍යාය

3. 6 ශ්‍රී ලංකාවේ මාවත්වාසී ළමයින් සම්බන්ධ තත්ත්වය (මෙතෙක් සිදු කෙරී ඇති අධ්‍යයන ඇසුරින්)

**සිව්වන පරිච්ඡේදය: අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම සහ අධ්‍යයන ක්ෂේත්‍රය ආශ්‍රිත මාවත්වාසී ළමයින් පිළිබඳ දත්ත විශ්ලේෂණය** 79 - 122

4 . 1 . කොළඹ නගරය හැඳින්වීම

4. 2 .කොළඹ කොටුව, පිටකොටුව ප්‍රදේශ ආශ්‍රිත මාවත්වාසී ළමයින් පිළිබඳ දත්ත විශ්ලේෂණය

පස්වන පරිච්ඡේදය: මාවත්වාසී ළමයින්ගේ අපගාමී චර්යාවන් 123 - 155
පිළිබඳ අධ්‍යයනය

හයවන පරිච්ඡේදය: නිගමන සහ යෝජනා 156 - 169

5.1. නිගමන

5.2. යෝජනා

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 170 - 176

ඇමිණුම්

# "මාවත්වාසී ළමයින්ගේ අපගාමී චර්යා රටාවන් "

## කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රයෙන්


## නිරංජි විජේවර්ධන


## සංක්ෂිප්තය

## (ABSTRACT)


ලෝකයේ බොහෝ රටවල නාගරික ප්‍රදේශ ආශ්‍රිතව අයාලේ යාමට හසු වී ඇති ළමා පරපුර සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. සමාජ විද්‍යාත්මක ව්‍යවහරය තුළ මෙම ළමයින් හැඳින්වෙන්නේ "වීදි දරුවන්" නොහොත් "මාවත්වාසී ළමයින්" වශයෙන්ය. නාගරික වීදි ආශ්‍රිතව අසම්මත ආර්ථික ක්‍රමෝපායන් අනුගමනය කරමින් ජීවත්වෙන තරුණ සහ වැඩිහිටි පුද්ගලයන් ඇතුලත් වන පුළුල් ප්‍රශ්නයක් පැවතියද ,වීදි දරුවන් පිළිබඳ සමාජ ප්‍රශ්නය විශේෂ වේ. තුන්වෙනි ලෝකයේ රටවල්වල නගර ආශ්‍රිතව මේ තත්ත්වය වඩාත් ප්‍රබල ගැටළුවක් බවට පත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රධාන නගරයක් ආශ්‍රිතවම වීදි ළමයින් දැක ගත හැකි අතර පර්යේෂණ සහ සමීක්ෂණ වලට අනුව කොළඹ නගරය විශේෂ වේ. ළමයින් දෙමාපියන්ගේ රැකවරණයෙන් තොරව වීදිවාසීන් බවට පත් වීම තීරණය වන්නේ ඔවුන් උපත ලබන පවුල් පසුබිම තුළය. මාවත්වාසී ළමයින් පිළිබඳව ප්‍රශ්නය සමාජ ප්‍රශ්නයක් බවට ව්‍යාප්ත වන්නේ ඔවුන් පවුලක වැඩිහිටියන්ගේ හෝ භාරකරුවන්ගේ රැකවරණයෙන් මිදීමත් සමගය. මේ තත්ත්වය තුළ ඉතා පහසුවෙන් සමාජ අපචාරයන් කෙරෙහි යොමු වීමේ ඉඩකඩක් පැවතීම එයට හේතුවයි . මත් ද්‍රව්‍යය ජාවාරම වැනි ව්‍යාපාර සඳහා ඔවුන් යොදා ගැනීම, පිරිමි සහ කාන්තා ගණිකා සේවාවන් කෙරෙහි ඉතා පහසුවෙන් පෙළඹීම ,සමාජ රෝග වාහකයන් බවට පත් විම ,සොර මැරකම් වැනි ජීවන වෘත්තීන් වලට පෙළඹීම හා දීර්ඝ කාලීනව ඒ ළග පරම්පරාවටද උපතින්ම එම සමාජ ආර්ථික තත්ත්වයන් තුළ ජීවත් වීමට සිදු වීම මේ තත්වයට නිදර්ශනයන්ය.

මෙම අධ්‍යයනයේ මූලික ඉලක්කය වී ඇත්තේ මාවත්වාසී ළමයින් ලෙස ශ්‍රී ලංකාවේ මාවත් ආශ්‍රය කොට ගෙන ජීවත් වන සහ විවිධ ක්‍රියාකාරකම්වල නියුක්ත වී ඇති ළමයින් පිළිබඳව, ඔවුන්ගේ චර්යා රටාවන් පිළිබඳව විමසා බැලීමය.ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ශ්‍රී ලංකාවේ මාවත්වාසී ළමයින් බහුලවම ජීවත්වන්නා වූ නාගරික කොට්ඨාශ ලෙස හඳුනා ගෙන ඇති කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රිත පරිසරය යොදා ගෙන ඇත. ජීවිතය පවත්වා ගෙන යාම සඳහා කුමන හෝ ආකාරයකින් මුදල් ඉපැයීම මෙම ළමයින්ගේ ප්‍රධාන අභිමතාර්ථයයි. එකී අභිමතාර්ථය සාධනය කර ගැනීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම් නීත්‍යානුකූලද නැද්ද යන්න පිළබඳව ඔවුන්ට අදාළ නැත. අවශ්‍ය වන්නේ ජීවිතය පවත්වා ගෙන යාමට මුදල් ඉපැයීම පමණක් වන නිසාම එකී අරමුණට ළගා වීමේදී , අපගාමී චර්යාවන්ට ඇති ප්‍රවේශයන් බහුලය. ඒ තත්ත්වය පිළිබඳ සංකල්පීය සහ න්‍යායාත්මක විග්‍රහයන් , මෙන්ම පර්යේෂණ ගැටළුව ,පර්යේෂණ අරමුණු සාක්ෂාත් කරනු වස් අධ්‍යයන ක්ෂේත්‍රය ආශ්‍රිතව ලබා ගත් තොරතුරුත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත විශ්ලේෂණයන් පදනම් කර ගනිමින් එළඹෙන ලද පර්යේෂණ ප්‍රතිඵලත් මෙම පර්යේෂණ නිබන්ධයෙහි අන්තර්ගත වේ. ළමයින් "මාවත්වාසී ළමයින්" බවට පත් වීමේ මූලධර්මය අධ්‍යයනය නොකර ඔවුන්ගේ චර්යාව පිළිබඳව විනිශ්චයන්ට පැමිණීමට නොහැකි නිසා ඒ තතත්වය පිළිබඳව මූලිකව සිදු කරන සාකච්ජාව තුළින් පර්යේෂණ අත්තිවාරම සකස් කර ඇත. මෙම ළමයින් කුමනාකාර කණ්ඩායමක්ද, ඔවුන්ගේ ස්වභාවය, සමාජ ආර්ථික තත්ත්වයන් ,දෛනික ක්‍රියාකාරකම්, මාවත් ආශ්‍රය කොට ගෙන ගොඩ නගා ගෙන ඇති සම්බන්ධතා ජාලය, පැවැත්ම සඳහා යොදා ගන්නා වූ උපාය උපක්‍රමයන් , එකී උපායන් ක්‍රමවේදයන් තුළ ඇති නීතිානුකූල වන බව හෝ නොවන බව යනාදී වූ කාරණා පිළිබඳව මෙහි අන්තර්ගත වේ. හඳුනාගත් මාවත්වාසී ළමයින්ගේ චර්යා රටාවන් පිළිබඳව සිදු කෙරුණු මෙම අධ්‍යයනය තුළින් ඔවුන් සමාජ ගැටළුවක් වී ඇති ආකාරයත් එකී සමාජ ගැටළුව විෂයෙහි යෙදිය හැකි විසඳුම් පිළිබඳවත් යෝජනා කර තිබේ.